# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/68 - 2021 අගෝස්තු මස 07 වැනි සෙනසුරාදා - 2021.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනත**

ඌව වෙල්ලස්ස, කොටබෝව, කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2021

ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ 2021 වාර්ෂික ඇසළ උත්සවය 2021.08.08 වැනි දින කප් සිටුවීමෙන් ආරම්භ වී 2021.08.23 වැනි දින අලුයම දිය කැපීමේ මංගල්‍යයෙන් නිමාවට පත්වන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව 1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි.

**ගුණදාස සමරසිංහ,**
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ කොටබෝව
කුඩා කතරගම ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2021 අගෝස්තු මස 02 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සව - 2021**

1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ කොටබෝව වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

**01. කඳවුරු ප්‍රදේශය :-**

කොටබෝවේ ''දහමල් ඔය'' නැමති පුරාණ තොටුපොළේ සිට සැතපුම් භාගයක අර්ධ විශ්කම්භය ඇතුළත ප්‍රදේශය ඇතුළත් වේ.

1A - G 34808 — 21 (2021/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**02. ගොඩනැගිලි ඉදිකිරීම් :-**

මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් හෝ 2021.08.08 වැනි දින සිට 2021.08.23 වැනි දින දක්වා කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළඳසැලක් ඉදි නොකළ යුතු ය.

**03. යාචකයෝ :-**

පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනක දී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදා දීමද නොකළ යුතු ය.

**04. නෑම සහ සේදීම :-**

කොටබෝවේ ''දහමල් ඔය'' නැමති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විශ්කම්භය ඇතුළත ප්‍රදේශය තුළ කිසිවෙකු විසින් දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම හෝ වාහන සේදීම නොකළ යුතු ය.

**05. වාහන :-**

05.01. මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසරයක් රහිතව මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (දහමල් ඔයෙන් නැගෙනහිරට) පැදවීම හෝ ඇතුලු කිරීම නොකළ යුතු ය.

05.02. කඳවුරට අයත් කඩබිම් ප්‍රදේශයේ වාහන නතර කිරීමට වෙන්කර ඇති රිය ගාල්වල හැර අන් කිසිදු ස්ථානයක වාහනයක් නතර කර නොතැබිය යුතු ය.

**06. කාවාඩි කඩ :-**

මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවෙකු විසින් කාවාඩි කඩ පිහිටුවනු නොලැබිය යුතු ය.

**07. වෙළඳාම :-**

07.01. මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයකින් තොරව කඳවුරු භූමිය තුළ තාවකාලික කඩ බදු දීම හෝ වෙන්දේසි කිරීම නොකළ යුතු ය. තවද මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ප්‍රදේශය තුළ නියම නොකරන ලද ස්ථානයක එවැනි කටයුතු සිදු කිරීම කිසිවකු විසින් නොකළ යුතු ය.

07.02. පූජා පෙදෙස, මඟී පාලමෙහි මාර්ගය හා කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුර අයුතු ලෙස ආක්‍රමණය කරන පරිදි යම් මඩුවක් තැනීම හෝ යම් ඉදිකිරීමක් කිරීම හෝ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් විශාල කිරීමක් නොකළ යුතු ය. එකී ප්‍රදේශයන් හි සංචාරක වෙළඳාම ද තහනම්ය.

07.03. මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ඒ සඳහා අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තින්නෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකළ යුතු ය.

07.04. යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් ගෙන යාමේ කාර්යය සඳහා සෑම ගොඩනැගිල්ලක, ඉදිකිරීමක හෝ ස්ථානයකම ප්‍රමාණයෙන් ඝණ අඩි 04 1/2 කට අඩු නොවන කුණු බාල්දියක් සපයා තිබිය යුතු ය. කුණු බාල්දියට කුණු දමන විට හා ඉන් ඒවා ඉවත් කරන විට හැර අන් සෑම විටම කුණු බාල්දිය පියනකින් වසා තැබිය යුතු ය. තවද සෞඛ්‍ය කම්කරුවන් විසින් කුණු ඉවත ගෙන යෑම සඳහා නියම කරනු ලැබූ වේලාවන්හීදී ඒ භාජන ඒ ස්ථානවල පිටතින් තැබිය යුතු ය.

07.05. විකිණීමට තබා ඇති සකස් කළ සියලු ආහාරපාන ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතු ය.

**08. සනීපාරක්ෂාව සහ මහජන සෞඛ්‍යය :-**

ඒ කාර්යය සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් මළ මුත්‍රා පහ නොකළ යුතු අතර, සලසා ඇති ස්ථානයක හෝ භාජනයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් ද්‍රව හෝ ඝණ කුණු කසල කිසිවක් නොදැමිය යුතු ය.

මවිසින් දෙන ලද මෙම ආඥාවන් කිසිම තැනැත්තකු විසින් කඩ නොකළ යුතු ය.

**ගුණදාස සමරසිංහ,**
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ කොටබෝව
කුඩා කතරගම ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2021 අගෝස්තු මස 02 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

08 - 319

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.